# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | : ශ්‍රී ලංකා සුරාබදු | යොමු අංකය | : EB/102/13 |
| | | | දිනය | : 2016.03.24 |
| 1.2 | අමාත්‍යාංශය | : මුදල් | යොමු අංකය | : MF1/22/Com/EXC/ |
| | | | දිනය | : 2016.04.07 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | | යොමු අංකය | : DMS/C2/1175 |
| | | | දිනය | : 2013.09.06 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | යොමු අංකය | : EST-3/RECRU/02/2325 |
| | | | දිනය | : 2016.03.02 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | යොමු අංකය | : NPC/3/2/14/SR-2 |
| | | | දිනය | : 2015.11.30 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | යොමු අංකය | : PSC/EST/03-01-02/04/2014 |
| | | | දිනය | : 2016.06.02 |

**02.** පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 **සේවා ගණය** : විධායක

3.2 **ශ්‍රේණිය** : සුරාබදු අධිකාරී, සහකාර සුරාබදු කොමසාරිස්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්, සුරාබදු කොමසාරිස්

3.3 **පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය** :

සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන අදාළ ආඥාපනත්, අණපනත් හා වෙනත් නියෝග යටතේ නීත්‍යානුකූල සුරා ප්‍රමිති කිරීම් වලින් ලැබිය යුතු සුරාබදු එකතු කිරීම හා අනවසර සුරා/මත්ද්‍රව්‍ය වැළැක්වීමේ ක්‍රියාවලිය සඳහා කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම හා අධීක්ෂණය සහ එම ක්‍රියාන්විතයන්හි පෞද්ගලිකව නිරතවීම. එනම්, පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ යම්කිසි විශේෂිත බල ප්‍රදේශයක් හෝ විශේෂ ඒකකයක් හෝ විෂය පථයක් බාරව සිටින විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් තමා යටතේ අධීක්ෂණය වන සුරාබදු ස්ථාන හා ඒකකවලට අනුබද්ධිත යටත් නිලධාරීන් පාලනය, මෙහෙයවීම සහ අධීක්ෂණයද ඒ යටතේ බලපත්‍ර ස්ථානවල අධීක්ෂණ කටයුතුද වේ.

3.4 <u>කාර්යයන් පැවරීම</u>

"ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක."

**04.** **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

**05.** **වැටුප්**

5.1 වැටුප් කේත අංකය : SL 1- 2016

5.2 වැටුප් පරිමාණය: රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x2170 – 110,895/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

| තනතුර | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| සුරාබදු අධිකාරී | 01 | 47,615 |
| සහකාර සුරාබදු කොමසාරිස් | 08 | 56,960 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් | 12 | 62,595 |
| සුරාබදු කොමසාරිස් | 20 | 76,175 |

සටහන :- 2020.01.01. දින දක්වා වැටුප ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි 2 වන උපලේඛනය පරිදි වේ.

**06.** **සේවා ගණයට අයත් තනතුර / තනතුරු**

**6.1** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| සුරාබදු අධිකාරී | 31 | සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට වැටෙන අදාල ආඥාපනත් යටතේ බලයලත් මත්පැන් ප්‍රමිතිකරණය නීති විරෝධී මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්කොළ නිවාරණය සහ වෙනත් නියමයන් අධීක්ෂණය පිළිබඳව කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම හා එම කාර්යයන්හි පෞද්ගලිකව නිරතවීම හා අදාල බල ප්‍රදේශයේ පවත්නා සුරාබදු ස්ථාන හා නිෂ්පාදනාගාර සහ විවිධ බලපත්‍ර ලත් ස්ථාන සම්බන්ධයෙන් අදාල විධිවිධාන ක්‍රියාත්මක කිරීම, පරිපාලනය කිරීම සහ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |
| සහකාර සුරාබදු කොමසාරිස් | 13 | |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් | 05 | සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට වැටෙන අදාල ආඥාපනත් යටතේ බලය ලත් මත්පැන් ප්‍රමිතිකරණය නීති විරෝධී මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්කොළ නිවාරණය සහ වෙනත් නියමයන් අධීක්ෂණය පිළිබඳව කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම හා එම කාර්යයන්හි පෞද්ගලිකව නිරතවීම, මානව සම්පත් කළමනාකරණය හා දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු කළමනාකරණය සහ නීති හා සංඛ්‍යා ලේඛන කටයුතු සහ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |
| සුරාබදු කොමසාරිස් | 02 | සුරාබදු දෙපාර්තමේන්තුවේ විෂය පථයට වැටෙන අදාල ආඥාපනත් යටතේ බලය ලත් මත්පැන් ප්‍රමිතිකරණය නීති විරෝධී මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්කොළ නිවාරණය සහ වෙනත් නියමයන් අධීක්ෂණය පිළිබඳව කණිෂ්ඨ නිලධාරීන් මෙහෙයවීම හා එම කාර්යයන්හි පෞද්ගලිකව නිරතවීම සහ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අදාල නොවේ

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :
සුරාබදු අධිකාරී

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 40% |
| කුසලතා | 60% |

7.2 විවෘත බඳවාගැනීම : අදාළ නොවේ

7.3 **සීමිත බඳවාගැනීම :**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : සුරාබදු අධිකාරී

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3.2.3 පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් :

I. තනතුරේ ස්ථිර කර ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙක් වීම හෝ වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ඇති තනතුරේ ස්ථිර කර ඇති සුරාබදු පරීක්ෂකවරයෙක් වීම

II. තනතුරට අදාළව සියලුම කාර්යක්ෂමතා කඩඉම් සමත්වී තිබීම

III. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම

IV. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

V. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

7.3.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය

7.3.2.5 වෙනත් : I. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

II. තනතුරට බඳවාගැනීමට අවශ්‍ය 7.3.2 සිට 7.3.2.5 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතුය.

7.3.3 වයස : අදාළ නොවේ

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබාගත් පිළිවෙල අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් ගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ඒකාබද්ධ ලකුණු වල ප්‍රමුඛතා අනු පිළිවෙලින් පවත්නා පුරප්පාඩු පුරවනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා අදාල විෂය පිළිබඳව වූ දැනුම | 100 | 40% |
| 2. සාමාන්‍ය දැනුම | 100 | 40% |

(විෂය නිර්දේශය ඇමුණුම 01 හි සඳහන් වේ.)

7.3.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසි හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් අනුමත කරනු ලබ ආයතනයක් විසින්

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාළ නොවේ.

7.3.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.කාර්ය සාධන ඇගයීම උපරිම ලකුණු | 20 | අදාළ නොවේ. |
| 2.සාධු සටහන්/ප්‍රශංසා උපරිම ලකුණු (අදාල තනතුරේ) | 30 | |
| 3.අදාල ක්ෂේත්‍රයේ පුහුණුවීම උපරිම ලකුණු (දෙපාර්තමේන්තුව විසින් නියමිත කරනු ලබන පුහුණුවීම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 15 | |
| 4. ක්ෂේත්‍රයට අදාල අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු (ඩිප්ලෝමා - 05, උපාධි - 10, පශ්චාත් උපාධි - 20) | 20 | |
| 5. විශිෂ්ය ක්‍රියා සඳහා | 10 | |
| 6.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 05 | |
| | 100 | |

7.3.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පල කිරීම මගින්.

7.4. **කුසලතා මත බඳවා ගැනීම:**

7.4.1. බඳවාගන්නා ශ්‍රේණිය : සුරාබදු අධිකාරී

7.4.2. සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3. පළපුරුද්ද හා අනෙකුත් සුදුසුකම් :

I. ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරේ වසර 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරියෙකු වීම හා තනතුරේ ස්ථිර කර තිබීම.

II. ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම

III. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.

IV. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

V. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

7.4.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් : I. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

II. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය 7.4.2 සිට 7.4.2.5 දක්වා සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3. වයස : අදාළ නොවේ

7.4.4. බඳවාගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ලකුණු ලබා ගැනීමේ කුසලතා අනුපිළිවෙළ මත පවත්නා පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

7.4.4.1. ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.4.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ : අදාළ නොවේ

7.4.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය | 40 | අදාළ නොවේ. |
| 2.කාර්යසාධන ඇගයීම (පූර්වාසන්න වසර 05හි) | 20 | |
| 3.සාධු සටහන් ප්‍රශංසා (ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරෙහි) | 15 | |
| 4. ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන සුදුසුකම් (පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලකුණු -05, පශ්චාත් උපාධි ලකුණු -10) | 10 | |
| 5. අදාල ක්ෂේත්‍රයේ පුහුණුවීම (එකට ලකුණු දෙක බැගින්) | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | 05 | |
| මුළු ලකුණු | 100 | |

7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පලකිරීම මගින්

**08.** කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | සුරාබදු අධිකාරි තනතුරට පත්වී වසර 03 ක් ගතවීමට පෙර | සීමිත තරඟ විභාගය මත බඳවා ගනු ලැබූ නිලධාරීන් සඳහා ලිඛිත පරීක්ෂණයකි. (ඇමුණුම 02) කුසලතා මත බඳවා ගනු ලැබූ නිලධාරීන් සඳහා වාචික පරීක්ෂණයකි. (ඇමුණුම 03) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර හෝ උසස්වීමක් ලබා නොමැති නම් සුරාබදු අධිකාරි තනතුරට පත්වී වසර 08 ක් ගතවීමට පෙර | වාචික පරීක්ෂණයකි (ඇමුණුම 04) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර / සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් වී වසර 08 ක් ගතවීමට පෙර | වාචික පරීක්ෂණයකි (ඇමුණුම 05) |

(විෂය නිර්දේශය ඇමුණුම 02,03,04 සහ 05 හි සඳහන් වේ)

8.2. කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : සියලුම තනතුරු සඳහා වසරකට දෙවරක්

8.3. කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින්

**09.** භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුගාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |



## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 සුරාබදු අධිකාරී තනතුරේ සිට සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම

#### 10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. සුරාබදු අධිකාරී තනතුරෙහි ස්ථිර කර තිබීම

II. සුරාබදු අධිකාරී තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත්ව තිබීම.

III. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම

IV. පූර්වාසන්න වසර 05 ක් තුළ සුරාබදු අධිකාරී තනතුරේ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

V. ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම

VI. ඉල්ලුම් කරන දින සිට පූර්වාසන්න වසර පහක (05) කාලයක් තුළ අවවා කිරීමක් හැර විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබිය යුතුය

10.1.1.2 **උසස් කිරීමේ ක්‍රමය** : රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සුරාබ කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තුගත අභ්‍යන්ත දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පල කිරීම මගි අයදුම්පත් කැඳවා ඉහත 10.1.1.1 හි සුදුසුකම් සම්පූර් කර ඇති අය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසි පත්කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහ සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මු පරීක්ෂණයකට ලක්කර එහිදී ලබා ගන්නා ලකුණු වැ කුසලතා අනුපිළිවෙළින් පවත්නා පුරප්පාඩු වලට සුදුස්ස තෝරා ගනු ලැබේ.

**සංලක්ෂය :-** සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උස කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොව නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සම වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය සඳහා (සුරාබදු අධිකාරී තනතුරෙහි වසර 05 ක සේවා කාලයෙන් පසු සෑම වසරකටම ලකුණු 05 බැගින්) උපරිම ලකුණු | 50 | අදාල නොවේ. |
| 2.කාර්ය සාධන ඇගයීම් උපරිම ලකුණු | 20 | |
| 3. උසස් අධ්‍යාපන සුදුසුකම් උපරිම ලකුණු (අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ලකුණු -05 පශ්චාත් උපාධි ලකුණු 10) | 10 | |
| 4.වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු උපරිම ලකුණු (දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු වලට අදාලව ලබා ඇති විශේෂ සහතිකයකට ලකුණු 02 බැගින්) | 05 | |
| 5. ප්‍රශංසා | 10 | |
| 6.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම උපරිම ලකුණු | 05 | |
| එකතුව | 100 | |

සටහන1: සුරාබදු අධිකාරි තනතුරේ සිට සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස්වන තෙක් වැටුප් වර්ධක උපයා ගැනීමටත් එම වැටුප් ක්‍රමයේ අඛණ්ඩ වැටුප් වර්ධක ලබා ගැනීමටත් හිමිකම ඇත.

10.2 සහකාර සුරාබදු කොමසාරිස් තනතුරේ සිට නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරේ අවම වශයෙන් වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

II. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරෙහි ස්ථිර කර තිබීම

III. තනතුරට අදාලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

IV. පිළිගත් රාජ්‍ය ආයතනයකින් හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයකින් (උදා:-ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක) සාමාන්‍ය කලමනාකරණය, රජයේ මුදල් රෙගුලාසි හා ගිණුම්, ආයතන සංග්‍රහය විෂයයන් අන්තර්ගත වූ සති අටකට (08) නොඅඩු පාඨමාලාවක සහතිකය ලබා ගැනීම අවශ්‍ය වේ.

V. පූර්වාසන්න වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

VI. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

10.2.1.2 **උසස් කිරීමේ ක්‍රමය** : රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තුගත අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පල කිරීම මගින් අයදුම්පත් කැඳවා ඉහත 10.2.1.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක්කර එහිදි ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළින් පවත්නා පුරප්පාඩු වලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**සංලක්ෂය :-** සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

| ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය (සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට පත්වී වසර තුනකට (03) පසු එක් වසරකට ලකුණු 05 බැගින්) | 60 | | අදාළ නොවේ. |
| 2.කුසලතාවය | | | |
| (අ) කාර්ය සාධන ඇගයීම (පූර්වාසන්න වසර 05 සඳහා) | 20 | 35 | |
| (ආ) උසස් අධ්‍යාපන සුදුසුකම් (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයකින් ලබාගත් ඕනෑම පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා-ලකුණු 05, පශ්චාත් උපාධියට - ලකුණු 10) | 10 | | |
| (ඇ) වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු | 05 | | |
| (03) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | | 05 | |
| **එකතුව** | 100 | | |

සටහන 2: ඉහත සුදුසුකම් ලත් නිලධාරීන් නොමැති අවස්ථාවලදී අදාළ රාජකාරි ඉටුකිරීමට හෝ වැඩ බැලීමට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සුදුසු නිලධාරීන් පත් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත සිදු කළ යුතුය.

10.2.2. සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස්වීම - අදාළ නොවේ

10.3 නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ සිට සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරේ අවම වශයෙන් වසර පහක (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම
II. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම
III. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරෙහි ස්ථිර කර තිබීම
IV. පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම
V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

**සංලක්ෂය :-** සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දින කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂම කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

10.3.1.2 **උසස් කිරීමේ ක්‍රමය :** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් දෙපාර්තමේන්තුගත අභ්‍යන්තර දැන්වීමක් සහ වෙබ් අඩවියේ දැන්වීමක් පල කිරීම මගින් අයදුම්පත් කැඳවා ඉහත 10.3.1.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත සඳහන් ලකුණු පරිපාටිය යටතේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට ලක්කර එහිදී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළින් පවත්නා පුරප්පාඩු වලට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**සංලක්ෂය :-** සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය සඳහා (නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරට පත් වී වසර 05ට පසු එක් වසරකට ලකුණු 05 බැගින් ) | | 60 | අදාළ නොවේ |
| 2. කුසලතාව | | 35 | |
| අ. කාර්ය සාධන ඇගයීම (පූර්වාසන්න වසර 05 සඳහා) | 20 | | |
| ආ. උසස් අධ්‍යාපන සුදුසුකම් (විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයකින් ලබා ගත් ඕනෑම උපාධි ඩිප්ලෝමා සඳහා-ලකුණු 05, පශ්චාත් උපාධි සඳහා - ලකුණු 10) | 10 | | |
| ඇ. වෘත්තීය පුහුණු / විශේෂ පුහුණු | 05 | | |
| 3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ඇගයීම | | 05 | |
| එකතුව | | 100 | |

සටහන 3: ඉහත සුදුසුකම් ලත් නිලධාරීන් නොමැති අවස්ථාවලදී අදාළ රාජකාරි ඉටුකිරීමට හෝ වැඩ බැලීමට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සුදුසු නිලධාරීන් පත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත සිදු කළ යුතුය.

11. තනතුරු වලට පත්කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ:

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ඇමුණුම 06 හි සඳහන් වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කලේ : අත්සන ..................................

.....................................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ජේ.එච්.එම්.එස්.පී.අබේසිංහ.........................

තනතුර : පරිපාලන නිලධාරී

දිනය : 2016.08. 15

පරීක්ෂා කලේ : අත්සන

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ගාමිණී මහගමගේ

තනතුර : සුරාබදු කොමසාරිස් (පාලන හා මානව සම්

දිනය : 2016.08. 16

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන : ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : එල්.කේ.ජී. ගුණවර්ධන

තනතුර : සුරාබදු කොමසාරිස් ජනරාල්

දිනය : 2016.08.17

නිලමුද්‍රාව

එල්. කේ. ජී. ගුණවර්ධන
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 34, ඩබ්. ජේ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

යොමු අංකය : MFI/22/Com/Exc

සුරාබදු දෙපාර්තමේන්තුවේ හි විධායක සේවා ගණයේ

තනතුරු සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:

නම:

ලේකම්

.................................. අමාත්‍යාංශය

දිනය : 2016. 04/24

එච්. පී. සුමනසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
පරිපාලන හා මානව සම්පත් සංවර්ධන
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

නිල මුද්‍රාව

---

යොමු අංකය : PSC/EST/03-01-02/04/2014

සුරාබදු දෙපාර්තමේන්තු හි විධායක සේවා ගණය (SL-01)

සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය 2016.06.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන:

නම:

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016-09-23

නිල මුද්‍රාව ..................................

**එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.